# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන් ආරක්ෂා කිරීමේ පනතේ 24 වගන්තිය මඟින් ස්ථාපනය කර ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය සාමාජිකයින් 5 සැදුම් ලත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන අධිකරණමය බලය සහිත ආයතනයක් වේ. එහි සභාපතිත්වය විශ්‍රාමික මහාධිකරන විනිසුරුවරයෙකු විසින් දරනු ලබයි. දූවා දරුවන්ගේ රැකවරණය අහිමි වූ ආර්ථික හැකියාවක් නොමැති අසරණ දෙමව්පියන් සඳහා එම දරුවන්ගෙන් මාසිකව නඩත්තුව සඳහා යම් මුදලක් අදාල අසරණ දෙමව්පියන් වෙත ලබා දීම මෙම මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වේ.

තම දරුවන්ගෙන් ස්වකීය අභිමතය පරිදි නඩත්තු මුදලක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමට දෙමාපියන්ට මෙමගින් අවස්ථාව සලසා දී ඇත. වැඩිහිටි මහ ලේකම් කාර්යාලය හරහා ලබා ගන්නා විධිමත් ඉල්ලුම් පත්‍රයක් මගින් නඩත්තු මණ්ඩලය වෙත පැමිණිලි ඉදිරිපත් කල හැකිය. සෑම බ්‍රහස්පතින්දා දිනකම නඩත්තු මණ්ඩලය රැස්වන අතර එහිදී එම ඉල්ලීම් සලකා බලා පාර්ශවකරුවන් කැඳවා විභාග කිරීම, සමථයකට පත් කිරීම හෝ විධිමත් පර්යේෂණයකින් පසුව නඩත්තු මුදල් නියම කිරීම සිදු කරනු ලැබේ. මණ්ඩලය විසින් නියම කරනු ලබන නඩත්තු මුදල් නිසියාකාරව නොගෙවන අවස්ථාවලදී අදාළ නියෝගය එම ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණය මගින් නඩත්තු අණ පනත යටතේ කරන ලද නියෝගයක් ලෙස බලාත්මක කරවා ගැනීමට හැකියාව ඇත. වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 40 වැනි වගන්තියේ “ඉ” වගන්තිය අනුව මණ්ඩලය විසින් නියම කරනු ලබන නියමයන් කඩ කරන පුද්ගලයකුට මහේස්ත්‍රාත් අධිකරණය මගින් කරනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව රුපියල් ලක්ෂයකට නොවැඩි දඩ මුදලක්, එක් වසරකට නොවැඩි බන්ධනාගාරගත කිරීමක් හෝ ඒ දඬුවම් දෙකම හෝ පැනවීමට බලය ඇත.